බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, අංක 554A, කොරළවැල්ල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, කොරළවැල්ල හි පිහිටි සර්වෙයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 520215 හි බෙදා වෙන් කරන ලද 77 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හතයි හතරක (හෙක්ටයාර් 0.0174) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ සහතික අංක 2516735 යටතේ ලියාපදිංචි කර ඇත.

### 3 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, අංක 554A, කොරළවැල්ල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, කොරළවැල්ල හි පිහිටි සර්වෙයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 520215 හි බෙදා වෙන් කරන ලද 78 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හතයි තුනක (හෙක්ටයාර් 0.0173) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ සහතික අංක 2512949 යටතේ ලියාපදිංචි කර ඇත.

### 4 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, අංක 555, කටුකුරුන්ද උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, කටුකුරුන්ද හි පිහිටි සර්වෙයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 520216හි බෙදා වෙන් කරන ලද 246 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස හෙක්ටෙයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි අටයි හයක (හෙක්ටෙයාර් 0.0586) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ සහතික අංක 42548813 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 07 වැනි දින.

12 - 710

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

මුනිගොඩ හකුරු දුෂාන්ත මධුර කුමාර හෙවත් දුෂාන්ත මධුර කුමාර විජේසූරිය.
ගිණුම් අංකය : 1103004215.
ණය ගිණුම් අංක : 2353300.

2019 ඔක්තෝබර් 25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. සී. කේ. පෙරේරා විසින් 2016 අගෝස්තු මස 2 වැනි දින සහතික කරන ලද අංක 113 සහ 2017 නොවැම්බර් මස 15 වැනි දින සහතික කරන ලද අංක 247 සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් නිලන්ත හල්පන්දෙනිය විසින් 2019 ජනවාරි මස 11 වැනි දින සහතික කරන ලද අංක 2561 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුනිගොඩ හකුරු දුෂාන්ත මධුර කුමාර හෙවත් දුෂාන්ත මධුර කුමාර විජේසූරිය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන අසූ අටයි හාර ලක්ෂ පනස් එක් දහස් පන්සිය දහසයයි ශත පනස් අටක (රු. 88,451,516.58) මුදලක් 2019 සැප්තැම්බර් මස 12 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන අසූ අටයි හාර ලක්ෂ පනස් එක් දහස් පන්සිය දහසයයි ශත පනස් අටක (රු. 88,451,516.58) මුදල අය කර ගැනීම සඳහා සහ 2019 සැප්තැම්බර් මස 13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 30,242,755.72 මුදලක් මත වර්ෂයකට 28% බැගින් සහ රු. 53,666,300.00 මුදලක් මත වර්ෂයකට 15.50% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට එකී අංක 113, 247 සහ 2561 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ඩෝප් වීදියේ, 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගඟබොඩ පත්තුවේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත අංක 193D - හම්ංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇත්කඳුර හම්ංගල හි පිහිටි "නාගස්කන්ද එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එෆ්. ගුරුගේ විසින් 1975 පෙබරවාරි මස 10 වැනි දින පිළියෙල කරන ලද අංක 15/75 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රධාන පාර මගින් ද, නැගෙනහිරට : ගම්වැසියන්ට සහ කිරිවැල්දූව වත්තට අයිතිවන ඉඩම මගින් ද, දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : නාගස්කන්ද අද්දර වත්ත, පාර සහ P. P. 12469හි පෙන්වන ලද ඉඩම් මගින් ද මායිම් වූ එකී අංක 15/75 දරන පිඹුර ප්‍රකාරව අක්කර දාහතරයි පර්චස් විසි දෙකක (අ. 14, රූ. 0, පර්. 22) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ඇල්පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව P 45/115 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. එන්. මෙන්ඩිස් විසින් 2016 ජූලි මස 23 වැනි දින පිළියෙල කරන ලද අංක 1462 දරන පිඹුරෙන් නැවත මැනීමට අනුව ඉහත කී ඉඩම් කොටස පහත විස්තර වේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, දකුණු ගඟබොඩ පත්තුවේ, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත අංක 193D - හම්ංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇත්කඳුර හම්ංගල හි පිහිටි "නාගස්කන්ද එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එන්. මෙන්ඩිස් විසින් 2016 ජූලි මස 23 වැනි දින පිළියෙල කරන ලද අංක 1462 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ප්‍රාදේශීය සභා පාර මගින් ද, නැගෙනහිරට : ස්වදේශිකයින් විසින් හිමිකම්ලත් කිරිවැල්දූව වත්ත මගින් ද, දකුණට : එම ඉඩමේ කොටස මගින් ද සහ බස්නාහිරට : අඩි 13 පළල එස්ටේට් පාර, නාගස්කන්ද අද්දර ඕවිට සහ නිවාස සිට ප්‍රධාන පාර දක්වා පාර, P. P. 12469/3 මගින් ද මායිම් වූ එකී අංක 1462 දරන පිඹුර ප්‍රකාරව අක්කර දාහතරයි පර්චස් පහළොවක (අ. 14, රූ. 0, පර්. 15) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 07 වැනි දින.

12 - 709

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එච්. ඩී. එස්. ඩී. ගුණතිලක.
ගිණුම් අංක : 0005 5005 7271.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017 අගෝස්තු මස 14 දාතම හා අංක 1565, 1567 සහ 1563 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හඩුවල දේවගේ සමන්ත ඩයස් ගුණතිලක යන අය බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 1565, 1567 සහ 1563 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හාර කෝටි විසි දෙලක්ෂ විසි හය දහස් හයසිය පනස් හයයි ශත හැත්තෑ නමයක (රු. 42,226,656.79) මුදලක් 2019 ඔක්තෝබර් මස 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හාර කෝටි විසි දෙලක්ෂ විසි හය දහස් හයසිය පනස් හයයි ශත හැත්තෑ නමයක (රු. 42,226,656.79) මුදල ද, 2019 ඔක්තෝබර් මස 17 දින සිට අංක 1565, 1567 සහ 1563 දරන උකස් බැඳුම්කර මත අයවියයුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර කෝටි හාර ලක්ෂ අට දහස් නමසිය අනූ නමයයි ශත අසූ අටක (රු. 40,408,999.88) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Four decimal Five per centum (4.5%) per annum (floor rate of 16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1565, 1567 සහ 1563 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මාස්පොත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, තිත්තවැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, තිත්තවැල්ල සහ බමුනැස්ස දෙමටගහපැලැස්ස පිහිටි "සීතා ඇළ ගෲප්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි මස 20 දාතම හා අංක 50/2015B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉබවත්ත, අංක 50/2015B දරන පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : අංක 50/2015B දරන පිඹුරේ ලොට් 2, දකුණට : බූ ඇළ දිගේ වෙන්කිරීම සහ බස්නාහිරට : බූ ඇළ දිගේ වෙන්කිරීම සහ ඉබවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර නමයයි රූඩ් තුනයි පර්චස් තිස් හතයි දශම හතරයි පහක් (A:09, R:03, P:37.45) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 50/2015B දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 51/124 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි 20 දාතම හා අංක 50/2015A දරන පිඹුරේ නිරූපිත ලොට් 2 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 1565 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මස්පොත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, තිත්තවැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, තිත්තවැල්ල දෙමටගහපැලැස්ස පිහිටි "සීතා ඇළ ගෲප්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි මස 20 දාතම හා අංක 50/2015B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 3315 දරන පිඹුරේ ලොට් B, නැගෙනහිරට : අංක 3315 දරන පිඹුරේ ලොට් B සහ බූ ඇළ දිගේ වෙන්කිරීම, දකුණට : බූ ඇළ දිගේ වෙන්කිරීම සහ බස්නාහිරට : අංක 50/2015B දරන පිඹුරේ ලොට් 01 සහ අංක 50/2015A දරන පිඹුරේ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර නමයයි රූඩ් තුනයි පර්චස් තිස් හතයි දශම හතරයි පහක් (A:09, R:03, P:37.45) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 50/2015B දරන පිඹුරට අනුව වෙළුම/ පත්ඉරුව K 51/123 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි 20 දාතම හා අංක 50/2012A දරන පිඹුරේ නිරූපිත ලොට් 2 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 1567 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

3. I. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මස්පොත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, හෙට්ටිගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, බමුනැස්ස ග්‍රාමයේ පිහිටි "චන්ද්‍රාණි වත්ත T. P. 142169හි කොටසක් වශයෙන් දැන් කියනු ලබන අඹේවත්ත" යයි කියනු ලබන ඉඩමට

බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි මස 20 දාතම හා අංක 50/2015A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන ආර්. අයි. බී. එච්. බන්ඩාර යන අය විසින් සාදන ලද අංක 334A දරන පිඹුරේ ලොට් 13 සහ 29, නැගෙනහිරට : අංක 334A දරන පිඹුරේ ලොට් 29 සහ සීතා ඇළ ගෲප්, දකුණට : සීතා ඇළ ගෲප් සහ ලොට් 2 (පාර සඳහා වෙන්කිරීම) සහ බස්නාහිරට : බලයලත් මානක තැන ආර්. අයි. බී. එච්. බන්ඩාර යන අය විසින් සාදන ලද අංක 334A දරන පිඹුරේ ලොට් 35 සහ 13 (පාර සඳහා වෙන්කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම දෙකක් (A:0, R:0, P:10.2) හෝ හෙක්ටයාර 0.0258ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 50/2015A දරන පිඹුරට අනුව ය.

II. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මස්පොත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, හෙට්ටිගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, බමුනැස්ස ග්‍රාමයේ පිහිටි "චන්ද්‍රාණි වත්ත T. P. 142169හි කොටසක් වශයෙන් දැන් කියනු ලබන අඹේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. ආරියරත්න යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි මස 20 දාතම හා අංක 50/2015A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 2 (පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 50/2015A දරන පිඹුරේ ලොට් 1, නැගෙනහිරට : සීතා ඇළ ගෲප්, දකුණට : සීතා ඇළ ගෲප් සහ බලයලත් මානක තැන ආර්. අයි. බී. එච්. බන්ඩාර යන අය විසින් සාදන ලද අංක 334A දරන පිඹුරේ ලොට් 35 සහ බස්නාහිරට : (ප්‍රාදේශීය සභා පාර) බලයලත් මානක තැන ආර්. අයි. බී. එච්. බන්ඩාර යන අය විසින් සාදන ලද අංක 334A දරන පිඹුරේ ලොට් 13 සහ ලොට් 35 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම අටක් (A:0, R:0, P:4.8) හෝ හෙක්ටයාර 0.0121ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 50/2015B දරන පිඹුරට අනුවය.

අංක 50/2015A දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 සහ 2 පහතින් විස්තර කොට ඇති ඉඩමේ ඒකාබද්ධයක් සහ නැවත මිනුම් ද වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුඩාගල්බොඩ කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මස්පොත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, හෙට්ටිගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, බමුනැස්ස ග්‍රාමයේ පිහිටි "චන්ද්‍රාණි වත්ත T. P. 142169හි කොටසක් වශයෙන් දැන් කියනු ලබන අඹේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. එම්. බී. එච්. බන්ඩාර යන අය විසින් සාදන ලද 1999 අගෝස්තු මස 24 දාතම හා අංක 334A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 34 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 13 (පාර සඳහා වෙන්කිරීම), නැගෙනහිරට : ලොට් 29, දකුණට : පියදාස සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන බේරුවලවත්ත සහ බස්නාහිරට : ලොට් 35 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (A:0, R:0, P:15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 334A දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 51/11 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 334A දරන පිඹුරේ ලොට් 49, 56, 2, 13, 46 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 1563 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 762/1

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එච්. ඩී. එස්. ඩී. ගුණතිලක.
ගිණුම් අංක : 0005 5005 7271.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.10.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2016 ඔක්තෝබර් මස 28 දාතම හා අංක 3251 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හඩුවල දේවගේ සමන්ත

ඩයස් ගුණතිලක යන අය බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 3251 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් රුපියල් එක්කෝටි අනූ හතර ලක්ෂ හැත්තෑ හතර දහස් හත්සිය තිස් දෙකයි ශත හතලිස් අටක (රු. 19,474,732.48) මුදලක් 2019 ඔක්තෝබර් මස 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි අනූ හතර ලක්ෂ හත්තෑ හතර දහස් හත්සිය තිස් දෙකයි ශත හතලිස් අටක (රු. 19,474,732.48) මුදල ද, 2019 ඔක්තෝබර් මස 17 දින සිට අංක 3251 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන තෙක්, රුපියල් හැත්තෑ පන්ලක්ෂයක (රු. 7,500,000.00) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Four decimal Five per centum (4.5%) per annum (floor rate of 16.5%) හා තවත් රුපියල් හැට ලක්ෂයක (රු. 6,000,000.00) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Four per centum (4.5%) per annum (floor rate of 16.%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 3251, දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ, ඉහළ බියංවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, ඉහළ කරගහමුල ග්‍රාමයේ පිහිටි ගනේමුල්ල පාර, වරිපනම් අංක 026 දරන "(නැදුන්මන්ඩිය යයි ලියාපදිංචි කොට ඇති) නුදුන්මණ්ඩියවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. පී. වී. සුනිල් කුසුම්සිරි යන අය විසින් සාදන ලද 2012 ජනවාරි මස 06 දාතම හා අංක 14/2012 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 11 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන පාර, නැගෙනහිරට : ස්ටේට් පාර, දකුණට : බලයලත් මානක තැන වී. එෆ්. ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1982 ජනවාරි 30 දාතම හා අංක 8007 දරන පිඹුරේ ලොට් 1 සහ බස්නාහිරට : ලොට් 10 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (A:0, R:0, P:15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 14/2012 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 38/17 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 762/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින් වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ෆෙයාර්වේ මිනර්වා (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0122 1000 4600.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.11.28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. කරුණාතිලක යන අය විසින් ලියා සහතික කරන ලද 2017 මාර්තු 28 දාතම හා අංක 1306 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 118118 දරන ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචි කිරීමේ නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගත කොට ඇති සමාගමක් වන ෆෙයාර්වේ මිනර්වා (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 1306 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එකසිය හතර කෝටි හතලිස් හත් ලක්ෂ විසි එක් දහස් නමසිය හැත්තෑ හතයි ශත හැට තුනක (රු. 1,044,721,977.63) මුදලක් 2019 නොවැම්බර් මස 04 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එකසිය හතර කෝටි හතලිස් හත් ලක්ෂ විසි එක් දහස් නමසිය හැත්තෑ හතයි ශත හැට තුනක (රු. 1,044,721.977.63) මුදල ද, 2019 නොවැම්බර්

මස 05 දින සිට අංක 1306 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුලුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් කෝටි සියයක (රු. 1,000,000,000.00) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Two decimal Five per centum (2.5%) per annum බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1306 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන්වන කේ. පී. එන්. සිල්වා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, C 31 පිටකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කෙහෙල්වත්ත, වෝඩ් අංක 18, අලුත්කඩේ පිහිටි ඕල්කොට් මාවත, වරිපනම් අංක 341, 341/1 දරන පරිශ්‍රයන් බලයලත් මානක තැන කේ. ජී. සී. කුලවංස යන අය විසින් සාදන ලද 2013 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 47-2013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 331 දරන පරිශ්‍රයන්, ඕල්කට් මාවත (පොලිස් නිල නිවාස) සහ වරිපනම් අංක 8 සහ 10 දරන පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස (මිහිඳු විද්‍යාලය), නැගෙනහිරට : වරිපනම් අංක 8 සහ 10 දරන පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස (මිහිඳු විද්‍යාලය) සහ එම්. ඩී. ගුණසේන මාවත, දකුණට : පාර සහ ඕල්කට් මාවත සහ බස්නාහිරට : ඕල්කොට් මාවත සහ වරිපනම් අංක 331 දරන පරිශ්‍රයන්, ඕල්කට් මාවත (පොලිස් නිල නිවාස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් පහයි දශම දෙකයි පහක් (A:0, R:3, P:5.25) විශාල ඉඩම් කොටස එකී අංක 47-2013 දරන පිඹුරට අනුවය.

එකී ලොට් X පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, C 31 පිටකොටුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සෙන් සෙබස්තියන් වෝර්ඩ් හි පිහිටි වරිපනම් අංක 341 දරන බලයලත් මානක තැන පී. ආර්. බොතේජු යන අය විසින් සාදන ලද 1946 නොවැම්බර් මස 29 දාතම හා අංක 3 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ලොට් C1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 331 දරන පොලිස් නිල නිවාස, (නොරිස් පාර), වරිපනම් අංක 8 සහ 10 දරන ට්‍රිනිටි දෙව්මැදුර පරිශ්‍රයන්, ට්‍රිනිටි පෙදෙස, නැගෙනහිරට : ලොට් C2, දකුණට : වරිපනම් අංක 343 දරන ලොට් D (නොරිස් පාර) සහ බස්නාහිරට : (නොරිස් පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විස්සක් (A:1, R:0, P:20) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ එකී අංක 3 දරන පිඹුරට අනුව D 181/122 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

12 - 764

---

### මහජන බැංකුව - යාපනය/ස්ටැන්ලිරෝඩ් - 030 ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඇ වගන්තිය යටතේ වන යෝජනා සම්මුතිය

ණයකරු : පද්මනාදන් සර්වානන්දන් මහතා.
ණය පහසුකම සහ මුදල :
වාණිජ්‍ය ණය - රු. 5,000,000.00
වාණිජ්‍ය ණය - රු. 3,000,000.00
ප්‍රදානය කළ දිනය :
වාණිජ්‍ය ණය : 2012.11.29
වාණිජ්‍ය ණය : 2016.06.15

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.10.25 දින පැවති සිය රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ලින්ගා තුරරාජාහ් මහත්මිය විසින් සහතික කරන ලද අංක 8924 දරන 2012.12.04 දිනැති මූලික උකස්කරය සහ යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ලින්ගා තුරරාජාහ් මහත්මිය විසින් සහතික කරන ලද අංක 10256 දරන 2016.06.16 දිනැති ද්විතීයික උකස්කරයට අදාළව මහජන බැංකුවට ගෙවීමට ඇති හිඟ මුදල්, අංක 61, අරසඩි පාර, කන්තර්මඩම්, යාපනය ලිපිනයෙහි පදිංචි පද්මනාදන් සර්වානන්දන් යන අය විසින් ගෙවීම පැහැර ඇති බැවින් සහ අංක 8924 සහ අංක 10256 දරන එකී උකස්කරයන්වලට අදාළව රුපියල් හතලිස් ලක්ෂ හතලිස් එක් දහස් හයසිය හැට හයයි ශත හැට නවයක් (රු. 4,041,666.69) සහ විසි දෙලක්ෂ හැට පන්දහස් පන්සියයක් (රු. 2,265,500.00) පමණක් මේ වන විට එකී මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද,

01. රුපියල් හතලිස් ලක්ෂ හතලිස් එක් දහස් හයසිය හැට හයයි ශත හැට නවයක් (රු. 4,041,666.69) වන මුදල 2012.11.29 වැනි දින සිට 22%ක පොළිය සහ රුපියල් විසි දෙලක්ෂ හැට පන්දහස් පන්සියයක් (රු. 2,265,500.00) වන මුදල 2016.06.15 වැනි දින සිට වෙන්දේසි දිනය දක්වා 17.5% පොළිය ද, පිරිවැය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඕ (29L) වගන්තිය යටතේ වෙන්දේසි ගාස්තු ද ඇතුළත්ව පසුව ලැබුණු කිසියම් ගෙවීමක්, ඇත්නම් ඒවා අඩුකර එකී මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා ඉහත සඳහන් කරන ලද අංක 8924 සහ 10256 දරන උකස්කරයන් මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන්, බලයලත් වෙන්දේසිකාර ඩලස් ජෙරම් කෙලාට් මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලබයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යාපනය මහ නගර සභා පරිපාලන සීමාවේ, කොට්ඨාස අංක 23හි වන්නාර්පන්නෙයි ඊසාන දෙසට වන්නට පිහිටි කුසවන්කුලම සහ කුසවන්කුලම්කරෙයි නැමති ඉඩමට බෙදා වෙන්කරන ලද ප්‍රමාණයෙන් 01, ලාච්චම් වී. සී. (ඩී 559/151හි ලියාපදිංචි), ප්‍රමාණයෙන් 07.6 කුළී (ඩී 559/152හි ලියාපදිංචි) සහ ප්‍රමාණයෙන් 13.5 කුළී (ඩී 570/130හි ලියාපදිංචි) යන ඉඩම් කොටස් ඒකාබද්ධ කොට බලයලත් මිනින්දෝරු කේ. කනගසබෙයි විසින් සාදන ලද අංක 4265/11 දරන 2011.05.26 දිනැති පිඹුරෙහි ලොට් අංක 1 ලෙස සඳහන් ප්‍රමාණයෙන් 2, ලාච්චම් වී. සී. 03.88 කුළී ඉඩම, ගොඩනැඟිලි සහ වෙනත් සියලු දෑ සමග මෙහි ඇතුළත් සියල්ල වේ. ප්‍රමාණයෙන් ලාච්චම් දෙකයි, වී සී සහ තුනයි දශම අටයි අටයි කුළී (2 ලාච්චම් වී. සී. සහ 3.88 කුළී) ඉඩම,

නැගෙනහිරට : ලූතර් සෙල්වරාසාගේ බිරිඳ, නවමනි උරුමකරුවන්ගේ දේපළ ද, උතුරට : ලූතර් සෙල්වරාසාගේ බිරිඳ, නවමනි උරුමකරුවන්ගේ දේපළ ද, බස්නාහිරට : ලූතර් සෙල්වරාසාගේ බිරිඳ, නවමනි උරුමකරුවන්ගේ දේපළ ද, දකුණට : අරස්ඩි මාර්ගය ද මායිම් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මගින්,

| | |
|---|---|
| එස්. නිත්තියානන්දන්, | කේ. කොඩීස්වරන්, |
| සහාකාර ප්‍රාදේශීය | ප්‍රාදේශීය කළමනාකරු, |
| කළමනාකරු, | මහජන බැංකුව, |
| මහජන බැංකුව, | ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, |
| යාපනය | යාපනය. |

12 - 765

### මහජන බැංකුව - කතරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29D වගන්තිය යටතේ යෝජනාව

ණයකරුගේ නම : අනුර මුණසිංහ රත්නායක මයා
ප්‍රදානිත මුදල : 01. රු. 7,000,000.00, 02. රු. 15,000,000.00
ප්‍රදානිත දිනය : 01. 2015.03.03 02. 2017.06.19
අවම ලංසුව

1986 අංක 32 දරන පනතින් සංශෝධන කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 25.10.2019 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව තීරණය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් ජී. විජේතුංග මහතා විසින් ලියා සහතික කරන ලද 2015.03.02 දිනැති අංක 6292 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අනුර මුණසිංහ රත්නායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද සහ එකී අංක 6292 දරන උකස්කරය යටතේ රුපියල් දහතුන් ලක්ෂ අනූනව දහස් නවසිය අනූ අටයි ශත අනූ හයක (රු. 1,399,998.96) මුදලක් සහ වර්ෂ 2019.05.03 වැනි දින සිට AWPLR + 1% + 2%ක් බැගින් පොළියක් ද ප්‍රසිද්ධ නොතාරිස් මංජුලා උක්වත්තගේ මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2017.06.15 දිනැති අංක 1063 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද සහ එකී අංක 1063 උකස්කරය යටතේ රුපියල් එක්කෝටි විසිපන් ලක්ෂයක (රු. 12,500,000.00) මුදලක් සහ වර්ෂ 2019.04.22 වැනි දින සිට AWPLR + 2.5%+ 2%ක් බැගින් පොළියක් ද, මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින්, එකී ණය මුදල් දෙක වන රුපියල් දහතුන් ලක්ෂ අනූනව දහස් නවසිය අනූ අටයි ශත අනූ හයක (රු. 1,399,998.96) මුදලක් මත වර්ෂ 2019.05.03 වැනි දින සිට AWPLR + 1%+ 2%ක් බැගින් පොළියක් ද, රුපියල් එක්කෝටි විසිපන් ලක්ෂයක (රු. 12,500,000.00) මුදලක් මත වර්ෂ 2019.04.22 වැනි දින සිට සියයට AWPLR + 2.5%+ 2%ක් බැගින් පොළියක් ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද වෙන්දේසි ගාස්තුව ද, වෙන්දේසි දිනය තෙක් යම් ගෙවීමක් කර ඇත්නම් ඒවාද අඩුකරගෙන අදාළ මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මිය විසින් එකී අංක 6292 සහ 1063 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතරගම ප්‍රාදේශීය සභා සීමාවේ, බුත්තල

කෝරළයේ, කතරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙටගමුව ගම පිහිටි "දෙටගමුව යාය" නමැති ඉඩමට, බලයලත් මානක ටී. බී. අත්තනායක මහතා විසින් මැන සකස් කරන ලද වර්ෂ 2004.02.08 දිනැති අංක M 1711 දරන සැලැස්මේ කැබලි අංක 01න් නිරූපිත බිම් ප්‍රමාණයට එකී පිඹුර ප්‍රකාර මායිම්,

උතුරට : F. T. P. 25 කැබලි අංක 270 ද, නැගෙනහිරට : F. T. P. 25 කැබලි අංක 270 සහ F. T. P. 25 කැබලි අංක 269 ද, දකුණට : F. T. P. 25 කැබලි අංක 269 සහ මෙම ඉඩමේම ඉතිරි කොටස ද, බටහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 01, පර්. 0) හෙවත් හෙක්ටයාර් 0.101ක් විශාල ඉඩම් කොටස සහ ඊට අයත් පරවශ්‍යතා අයිතීන් ද ඇතුලු සැම සියලු දේත් වේ.

මෙම ඉඩම් මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/S06/13 අංක දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමණාකාර,
මොණරාගල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 119, වැල්ලවාය පාර,
මොණරාගල.

12 - 766

---

## ලංකා බැංකුව

## 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.07.26 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් මෙත්තසිංහ වන්නි ආරච්චි අප්පුහිමිලාගේ සුලෝචනා ප්‍රියදර්ශනී විජේවික්‍රම විසින් සහතික කරන ලද 2015.08.14 සහ 15 දිනැති අංක 1079 දරන උකස් බැඳුම්කරයට අනුව ණය මත 2019.05.10 දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැට හත්ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය හැත්තෑහතරයි ශත හතක (රු. 6,771,374.07) මුදලක් සමග රුපියල් හැට තුන් ලක්ෂ හැත්තෑ හත් දහස් නවසිය අනූ දෙකයි ශත පනස් හයක (රු. 6,377,992.56) මුදලක් මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2019.05.11 වැනි දින සිට ගෙවීමේ සිදුකරන දිනය තෙක් තවදුරටත් පොලිය ද, වැල්ලම්පිටිය, වෙන්නවත්ත, අංක 135/1හි පදිංචි කුමාර් නානායක්කාර මහතා වෙතින් අයවිය යුතුව ඇත.

එකී 2015.08.14 සහ 15 දිනැති අංක 1079 දරන උකස් බැඳුම්කරයට අනුව අයවිය යුතු රුපියල් හැට හත් ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හතක (රු. 6,771,374.07) මුදල සමඟ 2019.05.11 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද අයකර ගැනීම සඳහා ඉහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතාට ද එකී ලංකා බැංකු ආඥා පනතේ 19 වන වගන්තිය (397 අධිකාරය) හා එහි සංශෝධන යටතේ ද ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ කළමනාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ මුල්ලේරියාව කොට්කාවත්ත ප්‍රාදේශීය සභා සීමාවේ, වෙන්නවත්ත, අංක 507 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි, වෙන්නවත්තෙහි පිහිටි, වෙන්නවත්ත පාරේ, දැනට වරිපනම් අංක 99 දරන ජම්බුගහවත්ත නමැති ඉඩමට එහි ඇති පස, ගොඩනැගිලි, ගහ කොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු S. වික්‍රමසිංහ විසින් සාදන ලද 2008 ජූලි මස 15 දිනැති අංක 10268 දරන පිඹුරෙහි ලොට් X ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් X, උතුරට : M. W. ප්‍රේමවතී බොතේජුගේ ඉඩම ද, නැගෙනහිරට : M. පද්මලතා පින්තෝගේ ඉඩම ද, දකුණට : සදහම් මාවත සහ පාර ද, බස්නාහිරට : ජගත් ශ්‍රීමන්තගේ ඉඩම සහ M. කිංස්ලි පින්තෝගේ ඉඩම ද මායිම්ව එකී අංක 10268 දරන පිඹුරට අනුව පර්චස් එකොළහයි දශම හතයි පහක (අ.0, රූ.0, පර්.11.75) හෙවත් හෙක්ටයාර 0.0297කින් යුක්ත වේ.

එකී ලොට් X පහත සඳහන් ඉඩමේ නැවත මැනීමකි. එනම්,

එකී වෙන්නවත්තෙහි පිහිටි වෙන්නවත්ත පාරේ, වරිපනම් අංක 99 සහ 101 දරන "ජම්බුගහවත්ත" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු A. C. S. ගුණරත්න විසින් සාදන ලද 1975 ජූලි මස 15 දිනැති අංක 6579 දරන පිඹුරෙහි සීමා විස්තර කොට නිරූපණයකර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම,

උතුරට : මෙරින්ජගේ ඩේවිඩ් ඩයස්ගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද, නැගෙනහිරට : L. පේදුරු පෙරේරාගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද, දකුණට : පාර සහ අතුකෝරලගේ කරෝලිස් පෙරේරාගේ උරුමකරුවන්ට අයත් ඉඩම් ද, බස්නාහිරට : අතු කෝරලගේ කරෝලිස් පෙරේරාගේ උරුමකරුවන්ට සහ මලුආරච්චිගේ පබ්ලිස් මර්තිස්ගේ උරුමකරුවන්ට අයත් ඉඩම් ද මායිම්ව පර්චස් එකොළහයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 11.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 104/120හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

S. D. සංජීව මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
ග්‍රෑන්ඩ්පාස් ශාඛාව.

12 - 776

---

## පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කළම්බු ගෝල්ඩ් සෙන්ටර් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණයදෙනුකරුවන්ගේ නම් : පරන්ජෝති රවින්ද්‍රන් හෙවත් පරන්ජෝති රවින්තිරන් සහ මුතුලිංගම් නිරෝජිනී (ආර්. පී. ටී. ඉලෙක්ට්‍රොනික්ස් හි හවුල්කරුවන්)

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2019 ක්වූ ඔක්තෝබර් මස 25 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී පරන්ජෝති රවින්ද්‍රන් හෙවත් පරන්ජෝති රවින්තිරන් සහ මුතුලිංගම් නිරෝජිනී (ආර්. පී. ටී. ඉලෙක්ට්‍රොනික්ස් හි හවුල්කරුවන්) යන අය "බන්ධනදායීන්" වශයෙන් ද, පරන්ජෝති රවින්ද්‍රන් හෙවත් පරන්ජෝති රවින්තිරන් යන අය "උකස්කරු" වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. ඒ. දයානන්ද විසින් සහතික කරන ලද වර්ෂ 2018.05.17 දිනැති අංක 590 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 590 දරන උකස්කරය මත,

වර්ෂ 2019.10.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දහහත් මිලියන නව ලක්ෂ විසි හතර දහස් එකසිය අනූ නවයයි ශත තිස් දෙකක (රු. 17,924,199.32) මුදලක් ද, වර්ෂ 2019.10.04 වැනි දින සිට රුපියල් දහහත් මිලියන එක් ලක්ෂ අනූ දහසක (රු. 17,190,000.00) මුදල මත වර්ෂයකට 19%ක පොළිය ද, ඉහත කී බන්ධනදායින්ගෙන්/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු රුපියල් දහහත් මිලියන නව ලක්ෂ විසි හතර දහස් එකසිය අනූ නවයයි ශත තිස් දෙකක (රු. 17,924,199.32) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොළොන්නාව, විහාර මාවතේ අංක 182/3(50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

01. බස්නාහිර පළාතේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මට්ටක්කුලිය, අංක 1 කොට්ඨාසයේ පිහිටි, මට්ටක්කුලිය ගොවිපල පාර, වරිපනම් අංක 3/609 දරන එක් ශාලාවකින්, එක් මුළුතැන්ගෙයකින් එක් නානකාමරයක් සහ වැසිකිළියකින් සමන්විත ලොට් 45හි ඉතිරි කොටසින් ආසන්න ප්‍රවේශය සහිත සහ බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සම්පාදිත 1994.10.05 දිනැති අංක 1708 දරන සහාධිපත්‍ය පිඹුරේ දැක්වෙන බිම් මහලේ ඒකක AB1 (කොටස) නැමති, උතුරින් : ලොට් 45 හි ඉතිරි කොටස සහ මෙම AB1 (කොටස) ඒකකය වෙන් කෙරෙන බිත්ති මධ්‍යය ද, නැගෙනහිරින් : මෙම AB1 (කොටස) ඒකකය සහ AB2 (කොටස) දරන ඒකකය වෙන් කෙරෙන බිත්ති මධ්‍යය ද, දකුණින් : මෙම AB1 (කොටස) දරන ඒකකය සහ ලොට් 45 හි ඉතිරි කොටස වෙන් කෙරෙන බිත්ති මධ්‍යය ද, බස්නාහිරින් : මෙම AB1 (කොටස) දරන ඒකකය සහ පිඹුරු අංක 41හි ලොට් 46 වෙන් කෙරෙන බිත්ති මධ්‍යය ද, මුදුනතින් : පළමු මහලේ AB1

(කොටස) දරන ඒකකයේ භූමියේ මධ්‍යය ද, පහතින් : මෙම AB1 (කොටස) දරන ඒකකයේ භූමි මධ්‍යය ද මායිම් වූ ප්‍රමාණයෙන් වර්ග අඩි 350 ක් හෝ වර්ග මීටර් 32.5කින් සමන්විත වන දේපළ සහ එකී සියලු දෙය වේ. මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු CON D 01/116හි ලියාපදිංචිව ඇත.

02. බස්නාහිර පළාතේ, (කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගර සභා සීමාවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මට්ටක්කුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මට්ටක්කුලිය, අංක 1 කොට්ඨාසයේ පිහිටි, මට්ටක්කුලිය ගොවිපල පාර, වරිපනම් අංක 3/609 දරන නිදන කාමර දෙකක්, සදළුතල දෙකක්, එක් නාන කාමරයක් සහ වැසිකිලිය, බරාඳය සහ පඩිපෙළකින් සමන්විත වන එකී පඩිපෙළ මතින් ආසන්න ප්‍රවේශය සහිත සහ බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සම්පාදිත 1994.10.05 දිනැති අංක 1708 දරන සභාධිපත්‍ය පිඹුරේ දැක්වෙන පළමු මහලේ ඒකක AB1 (කොටස) නමැති, උතුරට : මෙම AB1 (කොටස) දරන ඒකකයේ උතුරු බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම AB1 (කොටස) ඒකකය AB2 (කොටස) ඒකකයෙන් වෙන් කෙරෙන නැගෙනහිර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම AB1 (කොටස) දරන ඒකකයේ දකුණු බිත්තියේ මධ්‍යය ද, බස්නාහිරට : මෙම AB1 (කොටස) දරන ඒකකයේ බස්නාහිර බිත්තියේ මධ්‍යය ද, මුදුනතින් : මෙම AB1 (කොටස) දරන ඒකකයේ වහලයෙහි මධ්‍යය ද, පහතින් : මෙම AB1 (කොටස) දරන ඒකකයේ පොළවෙහි මධ්‍යය ද මායිම් වූ ප්‍රමාණයෙන් භූමි ප්‍රදේශය වර්ග අඩි 410 ක් හෝ වර්ග මීටර් 38.1ක් විශාලත්වය සහිත ඉඩම වේ. මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු CON D 01/118 හි ලියාපදිංචිව ඇත.

තව ද, AB1 ඒකකයන්හි භාවිතයට පමණක් වෙන්වූ X සලකුණු කළ කොළ පාටින් පාට කර ඇති මිදුලෙහි කොටසක් ද සමග වේ.

**පොදු අංගයන්**

01. ලොට් 45හි ඉතිරි කොටස, ප්‍රවේශය, ගේට්ටු, බිත්ති කාණු සහ මිදුලකින් සමන්විත ගොඩනැගිල්ල පිහිටි භූමිය.

02. ගොඩනැගිල්ලේ අත්තිවාරම, කුළුණු, බාල්ක, ආධාරක සහ ප්‍රධාන බිත්ති

03. විදුලිබල සහ දුරකථන සවි කිරීම්.

04. පොදු භාවිතය සඳහා පවතින ටැංකි, ජල ප්‍රවාහන වලවල්, සේවාවන්, උපකරණ සහ සවි කිරීම්.

05. දේපළේ අවශ්‍යතාවය සහ එහි පැවැත්ම, නඩත්තුව, ආරක්ෂාව හෝ එකී පොදු භාවිතයන් සඳහා සාමාන්‍යයෙන් අවශ්‍යවන සියලු අනිකුත් කොටස් සහ පහසුකම්.

06. X ලෙස සලකුණු කර කොළ පාටින් පාට කර ඇති AB 1 ඒකකයේ භාවිතාව සඳහා පමණක් වෙන් කළ මිදුලෙහි කොටස.

07. Y ලෙස සලකුණු කර කහ පාටින් පාට කර ඇති ඒකක AB 2හි භාවිතාව සඳහා පමණක් වෙන් කළ මිදුලෙහි කොටස.

08. X 1 ලෙස සලකුණු කර කහ පාටින් පාට කර ඇති වාහන නැවැත්වීමට පවතින මිදුලෙහි කොටස.

09. Y 1 ලෙස සලකුණු කර නිල් පාටින් පාට කර ඇති වාහන නැවැත්වීමට පවතින මිදුලෙහි කොටස.

පොදු අංග කොටස් වශයෙන් 760/1520 හෝ 70/6/141.2 හෝ 50%

| ඒකකය | විශාලත්වය | | කොටස |
|---|---|---|---|
| | වර්ග අඩි | වර්ග මීටර | |
| 1. AB1 (කොටස) (බිම් මහල) | 350 | 32.5 | 23% |
| 2. AB1 (පළමු මහල) | 410 | 38.1 | 27% |
| 3. AB2 (කොටස) (බිම් මහල) | 350 | 52.5 | 23% |
| 4. AB2 (කොටස) (බිම් මහල) | 410 | 38.1 | 27% |
| මුළු මුදල | 1520 | | 100% |

තව ද, බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සම්පාදිත 1992.03.08 දිනැති අංක 23 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3D (අඩි 30ක් පළල මාර්ග රක්ෂිතය), බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් සම්පාදිත 1992.11.07 දිනැති අංක 41 දරන පිඹුරේ දැක්වෙන ලොට් 55 (අඩි 30ක් පළල මාර්ග රක්ෂිතය) සහ එම පිඹුරේ ලොට් 64 (අඩි 30ක් පළල මාර්ග රක්ෂිතය) මතින් සහ ඔස්සේවන මාර්ග අයිතිවාසිකම සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.

12 - 736

**පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - ගම්පොළ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුවන්ගේ නම් : හේවා වඩුගේ තුෂාර සංජීව සහ මහමරක්කල පටබැඳිගේ ශාමිලා කෞශල්‍යා පෙරේරා.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2019 ක්වූ ඔක්තෝබර් මස 25 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, හේවා වඩුගේ තුෂාර සංජීව සහ මහමරක්කල පටබැඳිගේ ශාමිලා කෞශල්‍යා පෙරේරා යන අය "බන්ධනදායින්" වශයෙන් ද මහමරක්කල පටබැඳිගේ ශාමිලා කෞශල්‍යා පෙරේරා යන අය "උකස්කරු" වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. වෑගොඩපොළ විසින් සහතික කරන ලද වර්ෂ 2018.01.29 දිනැති අංක 2421 දරන ප්‍රාථමික උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 2421 දරන උකස්කරය මත,

(අ) වර්ෂ 2019.10.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දොලොස් මිලියන තුන් ලක්ෂ දහඅට දහස් හයසිය තිස්හතරයි ශත පනස් දෙකක (රු. 12,318,634.52) මුදලක් ද, වර්ෂ 2019.10.10 වැනි දින සිට රුපියල් දොළොස් මිලියන එක්දහස් නවසිය දහසයයි ශත දහ හතරක (රු. 12,001,916.14) මුදල මත වර්ෂයකට 15.5%ක පොළිය ද,

(ආ) වර්ෂ 2019.10.09 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දෙමිලියන හය ලක්ෂ තිස් දහස් පන්සිය හැත්තෑ නවයයි ශත තිස්තුනක (රු. 2,630,579.33) මුදලක් ද, වර්ෂ 2019.10.10 වැනි දින සිට රුපියල් දෙමිලියන පන්ලක්ෂ හැට අට දහස් හත්සිය හැට එකයි ශත දොළහ (රු. 2,568,761.12) මුදල මත වර්ෂයකට 15.5%ක පොළිය ද,

ඉහත කී බන්ධනදායින්ගෙන්/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්,

ඉහත කී උකස්කරය මත අයවිය යුතු රුපියල් දහහතර මිලියන නව ලක්ෂ හතලිස් නව දහස් දෙසිය දහතුනයි ශත අසූපහක (රු. 14,949,213.85) මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව කොළොන්නාව, විහාර මාවතේ අංක 182/3(50/3) හි පදිංචි බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

**උපලේඛනය**

01. මධ්‍යම පළාතේ, (මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ,) මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, ප්‍රාදේශීය සභා සීමාවේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බව්වාගම 1083 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බව්වාගම පිහිටි, ඉඹුල්පිටිය වතුයාය නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු පී. ඥාණප්‍රකාසම් විසින් සම්පාදිත 2011.02.20 දිනැති අංක 9916 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 නමැති උතුරු නැගෙනහිරට : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 47හි ඉතිරි කොටස සහ ලොට් 2 දරන පාර ද, දකුණු නැගෙනහිරින් : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 49 ද, දකුණු - බස්නාහිරින් : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 50 සහ 51 ද, උතුරු බස්නාහිරින් : පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ.0, රූ.2, පර්.0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ.

මෙම ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ.

මධ්‍යම පළාතේ, (මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාවේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බව්වාගම 1083 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බව්වාගම පිහිටි, ඉඹුල්පිටිය වතුයාය නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු පී. ඥාණප්‍රකාසම් විසින් සම්පාදිත 1986.04.30 දිනැති අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 48 නැමති උතුරු නැගෙනහිරින් : පාර සහ ලොට් 49 සහ 47 ද, දකුණු - නැගෙනහිරින් : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 49 ද,

දකුණු - බස්නාහිරින් : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 51 ද, උතුරු - බස්නාහිරින් : පාර ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම දේපළ ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරු A 111/46හි ලියාපදිංචිව ඇත.

02. මධ්‍යම පළාතේ, (මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, ප්‍රාදේශීය සභා සීමාවේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බව්වාගම 1083 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බව්වාගම පිහිටි, ඉඹුල්පිටිය වතුයාය නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු පී. ඥාණප්‍රකාසම් විසින් සම්පාදිත 2011.02.20 දිනැති අංක 9916 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 (පාර) නැමැති, උතුරින් : මෙම ඉඩමෙහි ඉතිරි කොටස ද, නැගෙනහිරින් : මෙම ඉඩමෙහි ඉතිරි කොටස සහ පාර ද, දකුණින් : පාර සහ අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 49 ද, බස්නාහිරින් : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 48 සහ 49 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.65) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ.

මෙම ඉඩම පහත දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වේ.

මධ්‍යම පළාතේ, (මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ, ප්‍රාදේශීය සභා සීමාවේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බව්වාගම 1083 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බව්වාගම පිහිටි, ඉඹුල්පිටිය වතුයාය නැමැති ඉඩම මැන බලයලත් මිනින්දෝරු පී. ඥාණප්‍රකාසම් විසින් සම්පාදිත 2010.12.13 දිනැති අංක 9850 දරන පිඹුරේ දැක්වෙන ඉඩම් කොටස (පාර) වන උතුරින් : මෙම ඉඩමෙහි ඉතිරි කොටස ද, නැගෙනහිරින් : මෙම ඉඩමෙහි ඉතිරි කොටස සහ පාර ද, දකුණින් : පාර සහ අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 49 ද, බස්නාහිරින් : අංක 1370 දරන පිඹුරේ දැක්වෙන ලොට් 49 සහ 48 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.65) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ අනිකුත් සියලු දෙය වේ. මෙම දේපළ ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු A 111/45හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.



## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - මහනුවර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණගණුදෙනුකරුවන්ගේ නම : ඇලහේන අදිකාරම් මුදියන්සේලාගේ රවින්ද්‍ර අභය කුමාර ඇලහේන සහ හේරත් මුදියන්සේලාගේ ශිරෝෂ් ඉරෝෂිකා හේරත්.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2019 ක්වූ ඔක්තෝබර් මස 01 වැනි දින ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, ඉහත කී ඇලහේන අදිකාරම් මුදියන්සේලාගේ රවින්ද්‍ර අභය කුමාර ඇලහේන සහ හේරත් මුදියන්සේලාගේ ශිරෝෂ් ඉරෝෂිකා හේරත් යන අය "බන්ධනදායීන්" වශයෙන් ද, ඇලහේන අදිකාරම් මුදියන්සේලාගේ රවින්ද්‍ර අභය කුමාර ඇලහේන යන අය "උකස්කරු" වශයෙන් ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ගම්පොළ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. වැගොඩපොළ විසින් සහතික කරන ලද වර්ෂ 2016.05.03 දිනැති අංක 1830 දරන ප්‍රාථමික උකස්කරය සහ වර්ෂ 2017.04.26 දිනැති අංක 2227 දරන ද්විතීයක උකස්කරය, මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතුවට "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) වෙත එකී අංක 1830 සහ 2227 දරන උකස්කරයන් මත,

01. වර්ෂ 2019.09.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් දහහත් ලක්ෂ හතලිස් තුන් දහස් හාරසිය පහයි ශත අසූවක (රු. 1,743,405.80) මුදලක් ද, වර්ෂ 2019.09.04 වැනි දින සිට රුපියල් දහසය ලක්ෂ අසූ දහස් අනූ තුනයි ශත හැට තුනක (රු. 1,680,093.63) මුදල මත වර්ෂයකට 18% ක පොළිය ද,

02. වර්ෂ 2019.09.03 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් ද අයවිය යුතු රුපියල් අනූ අට ලක්ෂ හැට අටදහස් හයසිය හැට හයයි ශත තිස් හයක (රු. 9,868,666.36) මුදලක් ද වර්ෂ 2019.09.04 වැනි දින සිට රුපියල් අනූ තුන් ලක්ෂ අසූ හය දහස් අටසිය අනූ හතයි ශත පනස් දෙකක (රු. 9,386,897.52) මුදල මත වර්ෂයකට 20%ක පොළිය ද,

03. වර්ෂ 2019.08.31 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් අයවිය යුතු රුපියල් පනස් එක් ලක්ෂ හැට දහස්

අටසිය හයයි ශත හැත්තෑ තුනක (රු. 5,160,806.73) මුදලක් ද, සහ වර්ෂ 2019.09.01 වැනි දින සිට රු. 5,000,000.00 මුදල දක්වා වාර්ෂිකව 19% බැගින් පොළිය ද, රු. 5,000,000.00ක මුදල ඉක්මවන මුදල මත වාර්ෂිකව 29% බැගින් පොළිය ද, ඉහත කී බන්ධනදායින්/උකස්කරුගෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

ඉහත කී උකස්කරයන් මත අයවිය යුතු රුපියල් දහසය මිලියන හත් ලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය හැත්තෑ අටයි ශත අසූ නවයක (රු. 16,772,878.89) මුළු මුදල සහ ඉහත සඳහන් දිනයේ සිට වෙන්දේසියේ දිනය දක්වා ඉහත සඳහන් කර ඇති ආකාරයට පොළිය ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසු) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇති, බැංකුව වෙත උකස්කර ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවත, අංක 369/1 හි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය වෙත අධිකාරය සහ බලය පවරන යෝජනාවක් මෙයින් සම්මත කර ගනු ලැබේ.

### උපලේඛනය

01. මධ්‍යම පළාතේ, (මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාවේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මන්දණ්ඩාවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මන්දණ්ඩාවෙල පිහිටි, "කළුදැවල එස්ටේට්" නැමති ඉඩම මැන බලයලත් මිනින්දෝරු ඒ. ජේ. බණ්ඩාර විසින් සම්පාදිත වර්ෂ 2006.09.15 දිනැති අංක 3002 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 1 දරන උතුරට : ලොට් 3 ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : නඩරාජාට අයත් ඉඩම සහ පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 21.7) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි නිවස, ගහ කොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේද වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරු A135/271හි ලියාපදිංචිව ඇත.

පිඹුරු අංක 3002හි සලකුණු කරන ලද ප්‍රවේශ මාර්ගය වේ.

02. මධ්‍යම පළාතේ, (මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ මහ නගර සභා සීමාවේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මන්දණ්ඩාවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මන්දණ්ඩාවෙල පිහිටි, "කළුදැවල එස්ටේට්" නැමති බලයලත් මිනින්දෝරු ඒ. ජේ. බණ්ඩාර විසින් සම්පාදිත වර්ෂ 2006.09.15 දිනැති අංක 3002 දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 2 දරන උතුරට : මෙම ඉඩමෙහි ඉතිරි කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩමෙහි ඉතිරි කොටස ද, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : පිඹුරු අංක 3002 හි ලොට් 1 සහ ලොට් 3 දරන අඩි 10ක් පළල ප්‍රවේශය ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේද වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු A135/272හි ලියාපදිංචිව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරිණි - ණය අයකර ගැනීම්.

12 - 737

---

### අමානා බැන්ක් පීඑල්සී (PB 3816 PQ) - ඔඩ්ඩමාවඩි ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද ලියාපදිංචි අංක PB 3618 PQ යටතේ ලියාපදිංචි වී ඇති පොදු බැංකු සමාගමකි.)

CIF අංකය : 148928.
ගනුදෙනුකරු : මොහොමඩ් ඉබ්‍රාහිම් අසනාර් සහ අසනාර් මොහම්මදු ඉබ්‍රහිම්.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ අමානා බැන්ක් පී. එල්. සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය.

අමානා බැන්ක් පී. එල්. සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019.10.19 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරනු ලැබූ බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 486, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තාවූ ද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූද, ලියාපදිංචි අංක PB 3618 PQ දරන අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙනුවෙන් ඔඩ්ඩමාවඩිහි ප්‍රසිද්ධ නොතාරිස්

එම්. බී. එම්. හුසේයින් විසින් සහතික කරන ලද 2014 ජූලි මස 21 දින අංක 9462 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත සහ 2015 අප්‍රේල් මස 01 වැනි දින අංක 9631 දරන ද්විතීය උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සහ මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. එම්. නූර්දීන් විසින් සහතික කරන ලද 2017 මාර්තු මස 27 වැනි දින අංක 32009 දරන තෘතීය උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම "බන්ධනදායීන්" යනුවෙන් හඳුන්වනු ලබන මොහොමඩ් ඉබ්‍රාහිම් අසනාර් සහ අසනාර් මොහම්මදු ඉබ්‍රහිම් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී උකස් බැඳුම්කර මත 2019 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට දැනට අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙත රුපියල් මිලියන නවයයි තුන් ලක්ෂ හැත්තෑ හය දහස් දෙසිය හතළිස් හතරයි ශත හතක් වූ (රු. 9,376,244.07) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රචාරක වියදම්, වෙනත් යම් පිරිවැය සහ ගාස්තු ද සමඟ 2019 ඔක්තෝබර් මස 01 වැනි දින සිට වර්ෂයකට 15.11%ක් වූ අනුපාතිකයක් යටතේ වූ ලාභය/ එකතු කළ ලාභය/ කුලී මුදල් සමඟ ඉහත කී රුපියල් මිලියන නවයයි තුන් ලක්ෂ හැත්තෑ හය දහස් දෙසිය හතළිස් හතරයි ශත හතක් වූ (රු. 9,376,244.07) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 9462, 9631 හා 32009 දරන උකස් බැඳුම්කර මගින් එකී අමානා බැන්ක් පී. එල්. සී. ආයතනය වෙත උකස් කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ, අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර යන ලිපිනයේ පදිංචි වෙන්දේසිකරුවන්, තක්සේරුකරුවන් සහ උසාවි කොමසාරිස්වරුන් වන අයි. ඩබ්. ජයසූරිය යන මහත්වරුන් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාර අමානා බැන්ක් පී. එල්. සී. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### උපලේඛනය

ප්‍රමාණයෙන් උතුරු පෙදෙසින් : අඩි 124ක් ද, නැගෙනහිර පෙදෙසින් අඩි 49ක් ද, දකුණු පෙදෙසින් අඩි 98ක් ද, දකුණු ලක්ෂයේ සිට බටහිර දෙසට අඩි 19ක් ද, බටහිර පෙදෙසින් අඩි 30ක් ද අන්තර්ගත වන නිරිත දිග කෙළවරේ පිහිටි බෙදා වෙන් කළ කොටසක් වන්නා වූ බලයලත් මිනින්දෝරු කේ. රත්නරාජා විසින් සාදන ලද 1998.08.30 වැනි දින අංක KPW/300 දරන මිනින්දෝරු පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තිහක් වූ ද (අ. 0, රූ. 03, පර්. 30), නැගෙනහිර පළාතේ, බටහිර කෝරළයේ, පත්තු ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, ඔඩ්ඩමාවඩි ග්‍රාමයේ, අංක 208B ඔඩ්ඩමාවඩි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මඩුවතුපාරේ පිහිටා ඇති "පල්ලතුවයල්" යනුවෙන් හඳුන්වනු ලබන උතුරට : එම්. අයි. අසනාර් වන අයට අයත් ඉතිරි ඉඩම් කොටස ද, නැගෙනහිරට : මෙම ඉඩම මගින් අත්හැර දමා ඇති මාර්ගය ද, දකුණු හා බටහිරට : මාර්ගය ද යන මායිම් තුළ පිහිටා ඇත්තාවූ ද බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස හා ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු ඒ. එම්. නජුවුදීන් විසින් සාදන ලද 2014.02.08 වැනි දින අංක AMN/14/KPW/3697 දරන මිනින්දෝරු පිඹුරට අනුව ඉහත සඳහන් ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත. එනම්,

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, බටහිර කොරළේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර කෝරළේ, පත්තු ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කොට්ඨාස අංක 02, ඔඩ්ඩමාවඩි ග්‍රාමයේ, හිටපු සභාපති පාරේ පිහිටා ඇත්තාවූ ද, උතුරට : එම්. අයි. අසනාර් යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : මාර්ගය ද, දකුණට හා බටහිරට : හිටපු සභාපති පාර ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද "පල්ලතුවයල්" යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රමාණයෙන් පර්චස් දහ නවයයි දශම එකයි අටක් වූ (අ. 0, රූ. 0, පර්. 19.18) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ එහි අන්තර්ගත වෙනත් සියලු දේ ද වේ.

ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී, ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතියට අත්සන් කිරීම සඳහා අමානා බැන්ක් පී. එල්. සී. ආයතනයේ අයකිරීම් අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර රීසා ඉස්මායිල් මහතාට බලය පැවරීමට ද තවදුරටත් යෝජනා සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රීසා ඉස්මායිල්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අය කිරීම් අංශය.

12 - 733

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1954001 සහ 2311427.

R D M D ටෙක්ස්ටයිල්.

2019 සැප්තැම්බර් මස 27 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2015 ජූනි මස 01 වැනි දින සහතික කරන ලද අංක 2287 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා

වූ ද, බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම R D M D ටෙක්ස්ටයිල් යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන යකන්දවල ලියන ආරච්චිලාගේ රෝහණ යකන්දවල ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2015 ජූනි මස 01 වැනි දින සහතික කරන ලද අංක 2288 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එල්. ජයවීර විසින් 2018 සැප්තැම්බර් මස 25 වැනි දින සහතික කරන ලද අංක 5327 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම R D M D ටෙක්ස්ටයිල් යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන යකන්දවල ලියන ආරච්චිලාගේ රෝහණ යකන්දවල ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම).

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2015 ජූනි මස 01 සහ 2018 සැප්තැම්බර් මස 25 වැනි දින දෙකේම සහතික කරන ලද 1998 හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අංක 21 යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද උකස් උපකරණ යටතේ අයවිය යුතු මුදල් ගෙවීම R D M D ටෙක්ස්ටයිල් යන නාමය සහ විලාසය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන යකන්දවල ලියන ආරච්චිලාගේ රෝහණ යකන්දවල ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 3 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම).

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2018 සැප්තැම්බර් මස 25 වැනි දින සහතික කරන ලද අංක 5328 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ඔෆ් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම R D M D ටෙක්ස්ටයිල් යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යන යකන්දවල ලියන ආරච්චිලාගේ රෝහණ යකන්දවල ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි 4 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම).

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන දෙසිය පනස් හයයි හය ලක්ෂ අසූ නව දහස් තුන්සිය විසි නවයයි ශත හැට තුන (රු. 256,689,329.63) ක මුදලක් 2019 අගෝස්තු මස 29 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් මිලියන දෙසිය පනස් හයයි හය ලක්ෂ අසූ නව දහස් තුන්සිය විසි නවයයි ශත හැට තුන (රු. 256,689,329.63) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2019 අගෝස්තු මස 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයකට රු. 79,678,100.00 ක මුදලක් මත වර්ෂයකට 8.75% බැගින් සහ රු. 153,300,000.00 ක මුදලක් මත වර්ෂයකට 16% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට එකී අංක 2287, 2288, 5327 උකස් උපකරණ සහ 5328 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද, මෙහි පහත 1 වන , 2 වන, 3 වන සහ 4 වන උපලේඛනයන් හි සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ 2 වන මහලේ, අංක 200 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

**ඉහත සඳහන් කළ 1 වන උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමා ඇතුළත මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 551බී - කුඩුවමුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුලත, කුඩුවමුල්ල ගමේ පිහිටි ශ්‍රී රතනජෝති මාවතේ, වර්තමානයේ වරිපනම් අංක 4/1 දරන පරිශ්‍රයේ පට්ටයන්ගොඩැල්ල වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් 2013.07.12 වැනි දින පිළියෙල කරන ලද අංක 6794 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : රොහාන් ප්‍රනාන්දු විසින් හිමිකම්ලත් අංක 1123 දරන පිඹුරේ ලොට් 2 මගින් ද, නැගෙනහිරට : ලොට් 6A මගින් ද, දකුණට : ලොට් 4A මගින් ද, සහ බස්නාහිරට : සරණසේන සහ අනිත් අය විසින් හිමිකම්ලත් අංක 1123 දරන පිඹුරේ ලොට් 1 සහ 5 මගින් ද මායිම් වූ එකී අංක 6794 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි පහ (අ. 0, රූ. 0, පර්. 25) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ලොට් 3A නැවත මැනීමක් පහත දැක්වෙන ඉඩමෙන් වේ.

ඉහත කී කුඩුවමුල්ල ගමේ පිහිටි පට්ටයන්ගොඩැල්ල වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් 1981.11.10 වැනි දින පිළියෙල කරන ලද අංක 1123 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 2 මගින් ද, නැගෙනහිරට : ලොට් 6 (අඩි 10 පළල පාර ප්‍රවේශය) මගින් ද, දකුණට : ලොට් 4 මගින් ද, බස්නාහිරට : ලොට් 5 සහ 1 මගින් ද මායිම් වූ එකී අංක 1123 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි පහක (අ. 0, රූ. 0, පර්. 25) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත්‍ර්ඉරුව D 112/28 යටතේ ලියාපදිංචි කර ඇත.

02. ඉහත කී කුඩුමුල්ල ගමේ පිහිටි ශ්‍රී රතනජෝති මාවතේ, වර්තමානයේ වරිපනම් අංක 4/2 දරන පරිශ්‍රයේ පට්ටයන්ගොඩැල්ල වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් 2013.07.12 වැනි දින පිළියෙල කරන ලද අංක 6794 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 4A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 3A මගින් ද, නැගෙනහිරට : කුරේගේ දේපල මගින් ද, දකුණට : කුරේගේ දේපළ මගින් ද, සහ බස්නාහිරට : සරණසේන සහ අනිත් අය විසින් හිමිකම්ලත් අංක 1123 දරන පිඹුරේ ලොට් 1 සහ 5 මගින් ද මායිම් වූ එකී අංක 6794 දරන පිඹුරේ ප්‍රකාරව පර්චස් එකොළහයි දශම බිංදුවයි හයක (අ. 0, රූ. 0, පර්. 11.06) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ලොට් 4A නැවත මැනීමක් පහත වේ.

ඉහත කී කුඩුවමුල්ල ගමේ පිහිටි පට්ටයන්ගොඩැල්ල වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් 1981.11.10 වැනි දින පිළියෙල කරන ලද අංක 1123 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 4 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 3 සහ ලොට් 6 (අඩි 10 පළල පාර ප්‍රවේශය) මගින් ද, නැගෙනහිරට : ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු සහ එම්. එස්. එස්. ලියෝ කුරේගේ දේපල මගින් ද, දකුණට : කේ. ජී. මහින්ද පියසේනගේ දේපළ මගින් ද සහ බස්නාහිරට : ලොට් 5 මගින් ද මායිම් වූ එකී අංක 1123 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහයි දශම බිංදුවයි හය (අ. 0, රූ. 0, පර්. 11.06) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත්‍රිරුව D 112/27 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 6794 දරන පිඹුරේ ලොට් 6A ලෙස විස්තර කරන ලද එකී අංක 1123 දරන පිඹුරේ දැක්වෙන ලොට් 6 (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම) මතින් සහ දිගේ මාර්ග අයිතිය සහ අනෙකුත් සම්බන්ධිත අයිතීන් සමග වේ.

**ඉහත සඳහන් කළ 2 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ නගර සභා සීමා ඇතුළත සුවරපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත සුවරපොල ගමේ පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ජයසුන්දර විසින් 2013.05.27 වැනි දින පිළියෙල කරන ලද අංක 8354 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට: එන්. කුරේගේ ඉඩම මගින් ද, නැගෙනහිරට : අඩි 12 පළල පුද්ගලික පාර වෙන් කරන කානුව මගින් ද, දකුණට : විජයරත්නගේ ඉඩම මගින් ද සහ බස්නාහිට : අංක 928 දරන පිඹුරේ ලොට් 3C හි කොටස සහ පුද්ගලික පාර මගින් ද මායිම් වූ එකී අංක 8354 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහ නවයයි දශම අසූ පහ (අ. 0, රූ. 0, පර්. 19.85) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල, පස සහ එහි පරිශ්‍රයේ පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත්‍රිරුව C 341/100 යටතේ ලියාපදිංචි කර ඇත.

1998.06.03 වැනි දින අංක 2534 දරන පිඹුරේ ලොට් 5 සහ දැන් එකී අංක 8354 දරන පිඹුරේ අඩි 12 පළල පුද්ගලික පාරක් ලෙස දක්වන ලද මතින් මාර්ග අයිතිය සමග වේ.

**ඉහත සඳහන් කළ 3 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත සහ 562C සුවරපොල බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සුවරපොල පිහිටි සර්වේයර් ජෙනාරල් විසින් පිළියෙල කරන ලද අංක 521201 දරන කැඩැස්තර සිතියමේ දැක්වෙන අංක 42 දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි දෙකයි අට (හෙක්ටයාර් 0.0328) වන අතර ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ සහතික අංක 2525795 කොළඹ යටතේ ලියාපදිංචි කර ඇත.

**ඉහත සඳහන් කළ 4 වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමා ඇතුළත, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 551 - කටුබැද්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත රාවතාවත්ත හි පිහිටි බණ්ඩාරනායක මාවතේ, වර්තමානයේ වරිපනම් අංක 16 දරන ස්ථානයේ "මොරටුව වලව්වත්ත හෙවත් වලව්වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එන්. ප්‍රනාන්දු විසින් 2011 ඔක්තෝබර් මස 14 වැනි සහ 20 වැනි දින පිළියෙල කරන ලද අංක 6657 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 1A (අඩි 12 පළල පාර සඳහා වෙන් කිරීම) සහ අංක 533 දරන පිඹුරේ ලොට් 2 මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 මගින් ද, දකුණට : එම ඉඩමේ ලොට් 7 මගින් ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 3 මගින් ද මායිම් වූ එකී අංක 6657 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසයයි දශම හතයි හතර (අ. 0, රූ. 0, පර්. 16.74) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

එකී ලොට් 3A නැවත මැනීමක් පහත දැක්වෙන ඉඩමෙන් වේ.

ඉහත කී රාවතාවත්ත හි පිහිටි බණ්ඩාරනායක මාවතේ, වර්තමානයේ වරිපනම් අංක 16 දරන ස්ථානයේ "මොරටුව වලව්වත්ත

හෙවත් වලව්වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. ප්‍රනාන්දු විසින් 1966.03.12 වැනි දින පිළියෙල කරන ලද අංක 533 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 3 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 1 (අඩි 12 පළල පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් 2 මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 5 මගින් ද, දකුණට : එකී අංක 9 දරන පිඹුරේ බලයලත් මිනින්දෝරු එච්. එල්. එම්. ද සිල්වා විසින් පිළියෙල කරන ලද අංක 252 දරන පිඹුරේ ලොට් D ලෙස පෙන්වන ලද එම ඉඩමේ ලොට් 7 මගින් ද සහ බස්නාහිරට : එකී අංක 9 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් 3 මගින් ද, මායිම් වූ එකී අංක 533 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 17.75) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D 230/111 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 6657 දරන පිඹුරේ දක්වෙන ලොට් 1A (අඩි 12 පළල පාර සඳහා වෙන් කිරීම) මතින් සහ දිගේ මාර්ග අයිතිය සහ අනෙකුත් සම්බන්ධිත අයිතීන් සමග වේ.

02. ඉහත කී රාවතාවත්ත හි පිහිටි බණ්ඩාරනායක මාවතේ, වර්තමානයේ වරිපනම් අංක 18 දරන ස්ථානයේ "මොරටුව වලව්වත්ත හෙවත් වලව්වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 2009.08.05 වැනි දින පිළියෙල කරන ලද අංක 5471/9000 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2A වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : බණ්ඩාරනායක මාවත මගින් ද, නැගෙනහිරට : බණ්ඩාරනායක මාවතේ, වරිපනම් අංක 20 දරන පරිශ්‍රය මගින් ද, දකුණට : එකී අංක 533 දරන පිඹුරේ ලොට් 3 මගින් ද සහ බස්නාහිරට : එකී අංක 533 දරන පිඹුරේ ලොට් 3 සහ ලොට් 1 (අඩි 12 පළල පාර) මගින් ද මායිම් වූ එකී අංක 5471/9000 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහ අටයි දශම අටයි පහ (අ. 0, රූ. 0, පර්. 18.85) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

එකී ලොට් 2A නැවත මැනීමක් පහත දක්වෙන ඉඩමෙන් වේ :

ඉහත කී රාවතාවත්ත හි පිහිටි "මොරටුව වලව්වත්ත හෙවත් වලව්වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. ප්‍රනාන්දු විසින් 1966.03.12 වැනි දින පිළියෙල කරන ලද අංක 533 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : කටුබැද්ද ප්‍රධාන පාර මගින් ද, නැගෙනහිරට : එකී අංක 9 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් 5 මගින් ද, දකුණට : ලොට් 3 මගින් ද සහ බස්නාහිරට : ලොට් 1 මගින් ද මායිම් වූ එකී අංක 533 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම හයයි තුන (අ. 0, රූ. 0, පර්. 20.63) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D 230/112 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 6657 දරන පිඹුරේ දක්වෙන ලොට් 1A (අඩි 12 පළල පාර සඳහා වෙන් කිරීම) මතින් සහ දිගේ මාර්ග අයිතිය සහ අනෙකුත් සම්බන්ධිත අයිතීන් සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 ඔක්තෝබර් මස 22 වැනි දින,

12 - 704

---

## කොමර්ෂල් බැංකු ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 1982247.

රීජන්ට් ට්‍රාන්ස්පෝර්ට් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2016 පෙබරවාරි මස 12 වැනි දින සහතික කරන ලද අංක 2888 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද, බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන බත්තරමුල්ල, පැලවත්ත, ඩී.පී. විජේසිංහ මාවතේ, අංක 594/2, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති රීජන්ට් ට්‍රාන්ස්පෝර්ට් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ චිත්‍රානි කාමලිකා වික්‍රම ආදිත්තිය විවාහයට පෙර සමරවික්‍රම උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම).

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2016 පෙබරවාරි මස 12 වැනි දින සහතික කරන ලද අංක 2889 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන බත්තරමුල්ල, පැලවත්ත, ඩී. පී. විජේසිංහ මාවතේ, අංක 594/2, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති රීජන්ට් ට්‍රාන්ස්පෝර්ට් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ චිත්‍රානි කාමලිකා වික්‍රම ආදිත්තිය විවාහයට පෙර සමරවික්‍රම

උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වන උපලේඛනයේ සවිතස්තරව විස්තර කරන ලද ඉඩම)

එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන දහ තුනයි හාර ලක්ෂ පනස් දෙදහස් අටසිය පනස් හතයි ශත දොළහක (රු. 13,452,857.12) මුදලක් 2019 සැප්තැම්බර් මස 12 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබි යුතු හෙයින් එකී රුපියල් මිලියන දහ තුනයි හාර ලක්ෂ පනස් දෙදහස් අටසිය පනස් හතයි ශත දොළහ (රු. 13,452,857.12) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2019 සැප්තැම්බර් මස 13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 12,599,000.00 ක මුදලක් මත වසර පහක් (05) ක් සඳහා ස්ථිර කරන ලද වර්ෂයකට 11.50% බැගින් PLR අගය + වර්ෂයකට 2.5% බැගින් ඊළඟ අවුරුදු දෙක (02) සඳහා වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩුකොට එකී අංක 2888 සහ 2889 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛනහි විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### ඉහත සඳහන් කළ 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමා තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත වර්තමානයේ, තලංගම දකුණ, පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 බී, දරන ස්ථානයේ පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවික්‍රම විසින් 2015.10.09 වැනි දින පිළියෙල කරන ලද අංක 4136 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 6 බී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : (අංක 1610 දරන පිඹුරේ ලොට් 6 ඒ) පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 බී දරන පරිශ්‍රය මගින් ද, නැගෙනහිරට : (අංක 356 දරන පිඹුරේ ලොට් 8) පාර මගින් ද, දකුණට : පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 ඒ දරන පරිශ්‍රය මගින් ද, සහ බස්නාහිරට : පාසැල් මාවතේ, වරිපනම් අංක 589 දරන පරිශ්‍රය මගින් ද මායිම් වූ එකී අංක 4136 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතයි දශම හතයි තුන (අ. 0, රූ. 0, පර්. 7.73) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

ඉහත ඉඩම නැවත මැනීමක් පහත විස්තර කරන ලද ඉඩමෙන් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමා තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත වර්තමානයේ, තලංගම දකුණ, පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 බී, දරන ස්ථානයේ පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඊ. විජේසූරිය විසින් 1991. 04. 04 වැනි දින පිළියෙල කරන ලද අංක 1610 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 6බී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 6ඒ මගින් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්ලිව්. පතිරණගේ , අංක 356 දරන පිඹුරේ ලොට් 8ඒ මගින් ද, දකුණට : බලයලත් මිනින්දෝරු ටී. එස්. ඊ. විජේසූරියගේ අංක 1573 දරන පිඹුරේ ලොට් 7ඒ මගින් ද, සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එම්. ජී. ද සිල්වාගේ අංක 3597 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් ඒ හි කොටස මගින් ද මායිම් වූ එකී අංක 1610 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතයි දශම හතයි තුනක (අ. 0, රූ. 0, පර්. 7.73) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 1707/153 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් පාර වෙන්කිරීම මතින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමා තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේ වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තලංගම දකුණ, හි පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පතිරණ විසින් 1984 අගෝස්තු මස 03 වැනි දින පිළියෙල කරන ලද අංක 356 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 8 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පාර මගින් ද, නැගෙනහිරින් : එම ඉඩමේ කොටස මගින් ද, දකුණට : ලොට් 7 මගින් ද සහ බස්නාහිරට : ලොට් 1 - 6 මගින් ද මායිම් වූ එකී අංක 356 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් තුන (අ. 0, රූ. 1, පර්. 3) ක විශාලත්වයෙන් වූ ඉඩම වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 798/51 යටතේ ලියාපදිංචි කර ඇත.

### ඉහත සඳහන් කළ 2 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමා තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත වර්තමානයේ, තලංගම දකුණ, පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 ඒ, දරන ස්ථානයේ පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවීර විසින් 2015.10.09 වැනි දින

පිළියෙල කරන ලද අංක 4136 ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් එක්ස් වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 බී දරන පරිශ්‍රය සහ (අංක 356 දරන පිඹුරේ ලොට් 8) අඩි 20 පළල පාර මගින් ද, නැගෙනහිරට : (අංක 356 දරන පිඹුරේ ලොට් 8) පාර සහ (අංක 7බී හි ඉතිරි කොටස) පාර මගින් ද, දකුණට : (අංක 7බී හි ඉතිරි කොටස) පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 594/2 එච් දරන පරිශ්‍රය මගින් ද, සහ බස්නාහිරට : පාසැල් මාවතේ, වරිපනම් අංක 583 සහ 583 ඊ දරන පරිශ්‍රය මගින් ද මායිම් වූ එකී අංක 4136 ඒ දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසයයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 16.50) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

ඉහත ඉඩම නැවත මැනීමක් සහ සවිස්තරව කරන ලද ඉඩම් වල ඒකාබද්ධ කිරීම පහත වේ.

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමා තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත වර්තමානයේ, තලංගම, පැළවත්ත - හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/12 බී, දරන ස්ථානයේ පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඊ. විජේසූරිය විසින් 1990. 10. 30 වැනි දින පිළියෙල කරන ලද අංක 1573 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7ඒ වශයෙන් දැකවෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 356 දරන පිඹුරේ ලොට් 6 සහ 8 මගින් ද, නැගෙනහිරට : අංක 356 දරන පිඹුරේ ලොට් 8 සහ අංක 1573 දරන පිඹුරේ ලොට් 7බී මගින් ද, දකුණට : ලොට් 7බී මගින් ද, සහ බස්නාහිරට : අංක 3597 දරන පිඹුරේ ලොට් ඒ ලකුණු කරන ලද ඉඩම් කොටස මගින් ද මායිම් වූ එකී අංක 1573 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොව (අ. 0, රූ. 0, පර්. 15) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 1707/154 යටතේ ලියාපදිංචි කර ඇත.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමා තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේ වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තලංගම දකුණ, පැළවත්ත-හෝකන්දර පාරේ, වරිපනම් අංක 70/10 (කොටස) දරන ස්ථානයේ හි පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පතිරණ විසින් 1995.06.30 වැනි දින පිළියෙල කරන ලද අංක 1623 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 7බී1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 356 දරන පිඹුරේ ලොට් 8 මගින් ද, නැගෙනහිරට : ලොට් 7බී හි ඉතිරු කොටස මගින් ද, දකුණට : ලොට් 7බී හි ඉතිරි කොටස මගින් ද සහ බස්නාහිරට : අංක 1573 දරන පිඹුරේ ලොට් 7ඒ මගින් ද මායිම් වූ එකී අංක 1623 දරන පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි එකයි දශම පහයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 01.50) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 798/273 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත දැක්වෙන පාර වෙන් කිරීම මතින් සහ දිගේ මාර්ග අයිතිය සමඟ වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමා තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 479 ඩී - කුමාරගේවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත තලංගම දකුණ, හි පිහිටි "කීල්ලේවත්ත සහ දෙල්ගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. පතිරණ විසින් 1984 අගෝස්තු මස 03 වැනි දින පිළියෙල කරන ලද අංක 356 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 8 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පාර මගින් ද, නැගෙනහිරට : එම ඉඩමේ කොටස මගින් ද, දකුණට : ලොට් 7 මගින් ද සහ බස්නාහිරට : ලොට් 1 - 6 මගින් ද මායිම් වූ එකී අංක 356 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් තුන (අ. 0, රූ. 1, පර්. 3) ක විශාලත්වයෙන් වූ ඉඩම වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 798/51 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 7 වැනි දින.

12 - 706

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2019.11.08 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. අයි. පී. විජයවික්‍රම විසින් 1 වන දේපළ මත සහතික කරන ලද 2017.05.02 දිනැති අංක 1152 දරන උකස් බැඳුම්කරය සහ 2018.12.27 දිනැති අංක 422 දරන උකස් බැඳුම්කරය මත ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. අයි. පී. විජයවික්‍රම විසින් දේපළ අංක 2 මත සහතික කරන ලද 2018.12.27 දිනැති අංක 423 දරන උකස් බැඳුම්කරය මත ලබාදෙන ලද ස්ථිර අයිරා පහසුකම මත 2019.10.03 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 5,230,724.39 ක මුදලක් සහ ණය පහසුකම් මත රු. 1,224,909.34ක මුදලක් සමග රු. 5,000,000 ක ස්ථිර අයිරා පහසුකමෙහි හිඟ හිටි මුල් මුදල මත වසරකට සියයට 15%ක බැගින් ද රු. 1,166,675 ක ණය පහසුකමෙහි හිඟ හිටි මුල් මුදල මත වසරකට 14% බැගින් ද, 2019.10.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද තොඩුවාව, තොඩුවාව උතුර, අංක 157හි

ලියන මොහොට්ටිගේ මෙලන් අසංක කබ්රාල් මහතා සහ ලියන මොහොට්ටිගේ හැරී ලෙනාඩ් කබ්රාල් මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. අයි. පී. විජයවික්‍රම විසින් 1 වන දේපළ මත සහතික කරන ලද 2017.05.02 දිනැති අංක 1152 දරන උකස් බැඳුම්කරය සහ 2018.12.27 දිනැති අංක 422 දරන උකස් බැඳුම්කරය මත ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. අයි. පී. විජයවික්‍රම විසින් දේපළ අංක 2 මත සහතික කරන ලද 2018.12.27 දිනැති අංක 423 දරන උකස් බැඳුම්කරය මත ලබාදෙන ලද ස්ථිර අයිරා පහසුකම සහ ණය පහසුකම මත අයවිය යුතු රු. 6,455,633.78 ක මුදල සමග 2019.10.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකුවේ ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි වියදම් හා මුදල් ද අයකර ගැනීම සඳහා ඉහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක **50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න** මහතාට ද එකී ලංකා බැංකු ආඥාපනතේ 19 වන වගන්තිය (397 අධිකාරය) හා එහි සංශෝධන යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට **ලංකා බැංකුවේ, මාදම්පේ ශාඛාවේ කළමනාකරු හටද** මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, යටකලං පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 531A තොඩුවාව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දකුණු තොඩුවාව ග්‍රාමයේ, එහෙත් දැන් උතුරු තොඩුවාව ලෙස ප්‍රසිද්ධ ග්‍රාමයේ පිහිටි අංක H 478 දරන පලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එෆ්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2007.10.25 දිනැති අංක 5380 දරන පිඹුරෙහි සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම උතුරට : මැඩෝනා ෆරීනා කුමාරිගේ ඉඩම ද, නැගෙනහිරට : එම්. ඇනී ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : මෙලන් අසංක කබ්රාල් ගේ ඉඩම සහ වෙරළ පාරේ සිට මහවැව දක්වා පාර (ප්‍රාදේශීය සභා) ද, බස්නාහිරට : අඩි 6 පළල මාර්ග රක්ෂිතය ද මායිම්ව රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම හයක (අ. 0, රූ. 1, පර්. 0.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, යටකලං පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 531A තොඩුවාව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දකුණු තොඩුවාව ග්‍රාමයේ එහෙත් දැන් උතුරු තොඩුවාව ලෙස ප්‍රසිද්ධ ග්‍රාමයේ පිහිටි අංක H 478 දරන පලුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ක්‍රිෂ්ණසාමි විසින් සාදන ලද 1978.09.30 දිනැති අංක 448 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට : එකී අංක 448 දරන පිඹුරෙහි ලොට් 3 ද, නැගෙනහිරට : පී. ලෝරන්ස් ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : තෝමස් එඩ්මන්ඩ් ස්ටැන්ලිගේ ඉඩම සහ පාර ද, බස්නාහිරට : එකී අංක 448 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා ඇති පාරට වෙන්කළ රක්ෂිතය ද මායිම්ව රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ සියලු දේ සමග වේ. මෙය මාරවිල, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 66/254 හි ලියාපදිංචි කර K 202/87 වෙත ගෙන ගොස් ඇත.

2. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, යටකලං පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තොඩුවාව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උතුරු තොඩුවාව ග්‍රාමයේ පිහිටි "මාදංගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එෆ්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2018.12.05 දිනැති අංක 7418 දරන පිඹුරෙහි සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම උතුරට : ටී. කැනීෂියස් ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : මර්සලීන් ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ක්‍රිස්තියානි දේවස්ථාන පාර ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු පී. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2009.11.23 දිනැති අංක, 3928 දරන පිඹුරෙහි ලොට් 1 ද මායිම්ව පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11.0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ සියලු දේ සමග වේ.

එකී ඉඩම පහත විස්තර කර ඇති යාබද ඉඩමෙන් බෙදූ පංගුවකි.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, යටකලං පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තොඩුවාව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උතුරු තොඩුවාව ග්‍රාමයේ "මාදංගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද 2009.12.01 දිනැති අංක 3928 පිඹුරෙහි ලොට් 1 හා 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ යාබද ඉඩම් කැබැල්ල උතුරට : ටී. කැනීෂියස් ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : මර්සලින් ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : මහවැව දක්වා වන ක්‍රිස්තියානි දේවස්ථාන පාර ද, බස්නාහිරට : තල්විල සිට හලාවත දක්වා ප්‍රධාන පාර ද මායිම්ව පර්චස් විසිපහක (අ. 0, රූ. 0, පර්. 25) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ සියලු දේ සමග වේ.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරලේ, යටකලං පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තොඩුවාව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උතුරු තොඩුවාව ග්‍රාමයේ පිහිටි "මාදංගහවත්ත"

නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජී. ෂෙල්ටන් සමරතුංග විසින් සාදන ලද 1992.09.02 දිනැති අංක 3813 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : එකී අංක 3813 දරන පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට : එකී අංක 3813 දරන පිඹුරෙහි ලොට් 3 ද, දකුණට : මහවැව දක්වා දිවෙන ක්‍රිස්තියානි දේවස්ථාන පාර ද, බස්නාහිරට : තොඩුවාව සිට ඉරණවිල දක්වා දිවෙන පාර ද මායිම්ව පර්චස් විසිපහක (අ. 0, රූ. 0, පර්. 25) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ සියලු දේ සමග වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 11/272හි ලියාපදිංචි කර K 106/275 වෙත ගෙන ගොස් ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. බී. ඒ. ආර්. කේ. බාලසූරිය මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
මාදම්පෙ ශාඛාව.

12 - 777

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.